රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 16/2022(I)

මගේ අංකය: EST-6/03/LEA/1060
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07.

2022.06. 26

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

## රජයේ කාර්යාල වෙත නිලධරයන් කැඳවීම සීමා කිරීම

ඉහත කරුණට අදාළව 2022.06.17 දිනැතිව නිකුත් කරන ලද රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 16/2022 කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.

02. එදිනෙදා ප්‍රවාහන පහසුකම් සලසා ගැනීමේදී මහජනතාව මුහුණ පා සිටින ගැටලුකාරී තත්ත්වය සැලකිල්ලට ගෙන, අත්‍යවශ්‍ය සේවාවන්වලට වඩා වැඩි ඉඩක් ලබාදීම වෙනුවෙන්, නැවත දැනුම් දෙන තුරු, උක්ත චක්‍රලේඛය අනුව අමාත්‍යාංශ ලේකම්වරුන්/පළාත් ප්‍රධාන ලේකම්වරුන්/දෙපාර්තමේන්තු ප්‍රධානීන්/ ආයතන ප්‍රධානීන් විසින් නිලධරයන් සේවා ස්ථාන වෙත කැඳවීම සම්බන්ධයෙන් තීරණය කිරීමේ දී ආයතනයේ එදිනෙදා රාජකාරි කටයුතු බිඳ වැටීමකින් තොරව පවත්වා ගෙන යාමට අත්‍යවශ්‍ය අවම කාර්ය මණ්ඩලය පමණක් සේවා ස්ථානය වෙත කැඳවීමටත්, හැකි සෑම අවස්ථාවක දී ම නිලධරයන්ට නිවසේ රැඳී සිටීමට ඉඩ දී ඔවුන්ගේ සේවය මාර්ගගත ක්‍රමය ඔස්සේ ලබා ගැනීමටත් ප්‍රමුඛතාව ලබා දී කටයුතු කරන ලෙස දන්වා සිටිමි.

03. මහජනතාව සමග සෘජුවම ගණුදෙනු කරන ආයතන වෙත නිලධරයන් කැඳවීම සම්බන්ධයෙන් තීන්දු තීරණ ගැනීම අදාළ අමාත්‍යාංශ ලේකම්ගේ/ පළාත් ප්‍රධාන ලේකම්වරුන්ගේ උපදෙස් සහ සමීප අධීක්ෂණය ඇතිව සිදු කිරීමට අදාළ ආයතන ප්‍රධානීන්/ප්‍රාදේශිය ප්‍රධානින් වග බලා ගත යුතුය.

04. මේ අනුව, මෙම කාලය තුළ උපරිමයෙන් ඉන්ධන පිරිමසා ගත හැකි ආකාරයට නිලධරයන්ගේ ගමන් බිමන් සීමා කළ යුතු අතර සියලුම රැස්වීම් සහ සාකච්ඡා මාර්ගගත ක්‍රමය ඔස්සේ පැවැත්වීමට ද කටයුතු කළ යුතුය.

05. තවද, රජයේ අත්‍යවශ්‍ය සේවාවන් පවත්වා ගෙන යාමට මෙයින් බාධාවක් නොවිය යුතු ය.

එම්.එම්.පී.කේ. මායාදුන්නෙ
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය